48549



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 45 | S | I |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

| | | |
|---|---|---|
| බෞද්ධ ශිෂ්ටාචාරය I | | පැය තුනයි |
| பௌத்த நாகரிகம் I | | மூன்று மணித்தியாலம் |
| **Buddhist Civilization I** | | *Three hours* |

විභාග අංකය: ..................................

**අයදුම්කරුවන්ට උපදෙස් :**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** යුක්ත වේ.

※ **I** කොටස අනිවාර්ය ප්‍රශ්න **20** කින් ද, **II** කොටස ප්‍රශ්න **08** කින් ද, සමන්විත වේ. **II** කොටසෙන් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

※ **I** කොටසේ පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** ලියා **II** කොටසේ පිළිතුරු පත්‍රය සමඟ එකට **අමුණා භාර දෙන්න.**

## I කොටස

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.)

● හිස්තැන් පුරවන්න.

1. 1.1 බ්‍රාහ්මණයා 'ද්විජ' නමින් හැඳින්වීමට සුදුසු වන්නේ ............................................ කර්මයෙනි.

1.2 ප්‍රාග් වෛදික යුගයේ කාන්තාවට ගෞරවණීය තත්ත්වයක් හිමි වූ බවට සාධකයක් ලෙස ............................... වන්දනය දක්විය හැකි ය.

1.3 අශ්වමේධ යාගය ............................................ බලය තහවුරු කර ගැනීමට පවත්වන ලද්දකි.

1.4 සාමඤ්ඤඵල සූත්‍රයේ විස්තර වන ආකාරයට මක්ඛලී ගෝසාල ............................................ වාදියෙකි.

1.5 පකුධකච්චායන ලොව සදකාලික කාය පදර්ථ ............................ ක් ඇතැයි ඉගැන්වී ය.

● නිවැරදි පිළිතුරෙහි **අංකය, වරහන තුළ ලියන්න.**

1.6 ක්‍රි. පූ. හයවැනි සියවස වන විට භාරතයේ පැවැති ප්‍රමුඛ රාජ්‍ය ගණන වූයේ,
(1) දෙකකි. (2) තුනකි.
(3) හතරකි. (4) සොළසකි. (.........)

1.7 ධම්මපදයෙහි යමක වග්ගයට අයත් ගාථා සංඛ්‍යාව වන්නේ,
(1) දොළසකි. (2) සොළසකි.
(3) විස්සකි. (4) විසිදෙකකි. (.........)

1.8 බුදුරජාණන් වහන්සේ, ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී, පුද්ගලයාගේ මෙලොව හා පරලොව හිත සුව පිණිස දේශනා කළ ධර්ම කරුණු සංඛ්‍යාව,
(1) හතරකි. (2) හයකි.
(3) අටකි. (4) දෙළසකි. (.........)

1.9 සතර සංග්‍රහවස්තු සඳහන් වනුයේ,
(1) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය. (2) මංගල සූත්‍රයේ ය.
(3) සිඟාලෝවාද සූත්‍රයේ ය. (4) පත්තකම්ම සූත්‍රයේ ය. (.........)

1.10 'සාමිස සුඛය' යනුවෙන් අදහස් වන්නේ,
(1) ධ්‍යාන සුවය යි. (2) අණන සුවය යි.
(3) පස්කම් සුවය යි. (4) නිවන් සුවය යි. (.........)

[ දෙවැනි පිටුව බලන්න.

- පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙහි ඇති **වරහන තුළ යොදන්න.**

1.11 වජ්ජි ජනපදයේ අගනුවර වූයේ විශාලාව යි. (.........)

1.12 චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි දස සක්විතිවත් දක්වා ඇත. (.........)

1.13 බුදුරජාණන් වහන්සේ පස්වෙනි වස් කාලය ගත කෙළේ විශාලා මහනුවර කූටාගාරශාලාවෙහි ය. (.........)

1.14 අග්ගඤ්ඤ සූත්‍රය දීඝනිකායට අයත් සූත්‍රයකි. (.........)

1.15 කාලාම සූත්‍රයෙහි දැක්වෙන 'න ආකාර පරිවිතක්කෙන' යන්නෙන් අදහස් වන්නේ කිසිවෙක් ස්වකීය කල්පනාවන්ට අනුරූප ව ප්‍රකාශ කරනු ලබන මතය **නො පිළිගත** යුතු බව යි. (.........)

- **'A'** කොටසට **ගැළපෙන** පිළිතුර **'B'** කොටසෙන් තෝරා ගෙන, එහි **අංකය වරහන තුළ ලියන්න.**

| 'A' කොටස | | 'B' කොටස |
|---|---|---|
| 1.16 පූර්ණ මනුෂ්‍යාත්වය අංග ලක්ෂණ පහකින් යුක්ත බව ඉගැන්වූයේ, | (.........) | 1. ශරතුස්ත්‍රතුමා ය. |
| 1.17 "ඔබ මේ සියල්ල දන්නෙහි ය. මම ඔබ තුළින් එය මතුකර ගතිමි." මෙම ප්‍රකාශය කෙළේ | (.........) | 2. බුදුරජාණන් වහන්සේ ය. |
| 1.18 මහජන ස්වාධිපත්‍යය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කෙළේ | (.........) | 3. ජීන් ජැක් රූසෝ ය. |
| 1.19 සත්ත්වයාගේ පැවැත්ම හේතුඵල ධර්මතාවට අනුව සිදුවන බව ඉගැන්වූයේ, | (.........) | 4. සොක්‍රටීස්තුමා ය. |
| 1.20 සීසෑම, වැපිරීම, වල් නෙළීම, අස්වැද්දීම වැනි ක්‍රියා කුසලකර්ම ලෙස හැඳින්වූයේ, | (.........) | 5. කොන්ෆියුසියස්තුමා ය. |

❊❊

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**45 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

# බෞද්ධ ශිෂ්ටාචාරය I
# பௌத்த நாகரிகம் I
# Buddhist Civilization I

- ❊ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ❊ තෝරා ගත් ප්‍රශ්නවල කොටස් **හතරට ම** වෙන වෙන ම පැහැදිලි ව පිළිතුරු සපයන්න.
- ❊ ප්‍රශ්න කොටස් මිශ්‍ර කර තෝරා ගනිමින් පිළිතුරු සැපයීම **නො කළ** යුතු ය.

## II කොටස

2. (i) ආර්ය-අනාර්ය භේදය භාරතය තුළ ඇති වූ ආකාරය පෙන්වා දෙන්න.
   (ii) චතුර්වර්ණයේ ප්‍රභවය පිළිබඳ බ්‍රාහ්මණ විවරණය ගෙනහැර දක්වන්න.
   (iii) බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව වෛශ්‍ය වර්ණයට අයත් වූ 'ස්වධර්මය' කෙටියෙන් හඳුන්වන්න.
   (iv) සමාජය තුළ වර්ණ හතරක් ප්‍රභවය වූයේ කෙසේද'යි බුදු දහමේ දක්වෙන විවරණය පැහැදිලි කරන්න.

3. (i) බ්‍රාහ්මණ-ආධිපත්‍යය යටතේ භාරතීය කාන්තාවන්ට නියම කර තිබූ කාර්යභාරය පෙන්වා දෙන්න.
   (ii) පවුල් ඒකකය තුළ කාන්තාවන්ට බුදුසමයෙන් හිමිකර දුන් වැදගත් ස්ථානය පෙන්වා දෙන්න.
   (iii) විමුක්ති සාධනයෙහි ලා ස්ත්‍රීත්වය බාධාවක් **නො වන** බවට සාධක බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් ගෙනහැර දක්වන්න.
   (iv) දූ දරුවන් විසින් මවුපියන් විෂයයෙහි ඉටු කළයුතු යුතුකම් හා වගකීම් කවරේද'යි සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

4. (i) බුද්ධකාලීන භාරතයේ දියුණු කෘෂි - ආර්ථික ජීවන රටාවක් පැවතුනු බව සනාථ කරන්න.
   (ii) ක්‍රිස්තු පූර්ව හය වන සියවස වන විට භාරතීය සමාජය නාගරිකරණයට ලක් ව තිබූ ආකාරය පෙන්වා දෙන්න.
   (iii) බුදුරදුන් වැඩසිටි සමයෙහි භාරතයේ ක්‍රියාත්මක ව පැවැති ගණතන්ත්‍ර පාලන ක්‍රමය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   (iv) සමකාලීන භාරතීය පාලකයන් බුදුරදුන් සමග පැවැත් වූ සමීප සම්බන්ධතා ගෙනහැර දක්වන්න.

5. (i) අජිත කේසකම්බලතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් කෙටියෙන් දක්වන්න.
   (ii) එම ඉගැන්වීම් සමාජ - සදාචාරය විෂයයෙහි කෙබඳු බලපෑමක් සිදු කෙළේ දැයි පරීක්ෂා කරන්න.
   (iii) සොක්‍රටීස්තුමාගේ මූලික ඉගැන්වීම් සදාචාරවත් සමාජයක් ගොඩනැගීමෙහි ලා කෙසේ උපයෝගී කොට ගත හැකිද'යි විමසීමක් කරන්න.
   (iv) බුදුසමයෙන් ශ්‍රාවකයාට හිමිකර දී ඇති ස්වාමිත්වය හා ස්වාධීනත්වය පැහැදිලි කරන්න.

6. (i) "රාජ්‍යයේ ප්‍රභවය" පිළිබඳ බෞද්ධ සූත්‍රධර්මවල සඳහන් ඉගැන්වීම් කෙටියෙන් දක්වන්න.
   (ii) සක්විති රජකු විසින් ක්‍රියාත්මක කළ යුතු රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය කුමක්ද'යි හඳුන්වා දෙන්න.
   (iii) රටක මනා ආර්ථික සංවර්ධනයක් උදෙසා රාජ්‍ය පාලකයන් විසින් ගතයුතු දැහැමි ක්‍රියාමාර්ග බුද්ධ දේශනා ඇසුරෙන් විස්තර කරන්න.
   (iv) රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වලට අනුව දේශපාලන හා ආර්ථික සුරක්ෂිතතාව විෂයයෙහි ජනතාව වෙත පැවරෙන යුතුකම් හා වගකීම් කවරේද'යි පැහැදිලි කරන්න.

[ හතරවෙනි පිටුව බලන්න.

**7.** (i) පෘථග්ජනයා හා ආර්යශ්‍රාවකයා අතර ඇති වෙනස පෙන්වා දෙන්න.

(ii) ශ්‍රාවක සංඝ සංඛ්‍යාවට ඇතුළත් වන්නේ කවුරුන්දැ'යි හඳුන්වා දෙන්න.

(iii) පුද්ගලයාගේ පරිහානියට බලපාන හේතුසාධක පරාභව සූත්‍රය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(iv) හොඳ - නරක ක්‍රියා විනිශ්චය කිරීමෙහි ලා පාදක කොට ගතහැකි බෞද්ධ නිර්ණායක ප්‍රමාණවත් ව ගෙනහැර දක්වන්න.

**8.** (i) අප්පිච්ඡතා ගුණය ප්‍රගුණ කිරීමෙන් ලද හැකි ආනිසංශ කවරේදැ'යි පැහැදිලි කරන්න.

(ii) බෞද්ධ ආරාමය ඇසුරෙන් බිහි වී ඇති නිර්මාණාත්මක සෞන්දර්ය අංග, සංවේදී ශ්‍රාවක ජනතාවක් බිහිකිරීමට සමත් වී ඇති ආකාරය පෙන්වා දෙන්න.

(iii) විවේකය අර්ථසම්පන්න ව ගතකිරීමට බුදුසමයෙන් අනුමත ක්‍රියාමාර්ග මොනවාදැ'යි හඳුන්වා දෙන්න.

(iv) බුදුසමයට අනුව 'යථාර්ථාවබෝධය' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැ'යි විස්තර කරන්න.

**9.** (i) භෝග විනාශයට බලපාන හේතුසාධක සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ - සංවර්ධනයට හා සහජීවනයට ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

(iii) "ජයං වෙරං පසවති" යනාදී ගාථාව නිවැරදි ව සම්පූර්ණකොට ලියා, එහි අර්ථය ද පැහැදිලි කරන්න.

(iv) ජය - පරාජය පිළිබඳ බුදුරදුන්ගේ ආකල්පය සමාජ ගැටුම් නිරාකරණය සඳහා උපයෝගී කර ගත හැකි අයුරු පෙන්වා දෙන්න.

* * *

The National e-learning Portal for The General Education

AL/2010/45-S-II 48527

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

45 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
**Buddhist Civilization II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය: ..................................

**අයදුම්කරුවන්ට උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** යුක්ත වේ.
- I කොටස අනිවාර්ය ප්‍රශ්න **20** කින් ද, II කොටස ප්‍රශ්න **08** කින් ද, සමන්විත වේ. II කොටසෙන් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- I කොටසේ පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ එකට අමුණා භාර දෙන්න.

## I කොටස

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.)

- හිස්තැන් පුරවන්න.

1. 1.1 තපස්සු - භල්ලුක වෙළඳ දෙබෑයෝ ප්‍රථම ........................................ උපාසකයෝ වූහ.

1.2 බුදුරදුන් වෙතින් පැවිද්ද ලැබූ මුල් ම ගිහියා වූයේ ........................................ ය.

1.3 බුදුරජාණන් වහන්සේ තුළ පැවැති පුබ්බේනිවාසානුස්සති - දිබ්බචක්ඛු - ආසවක්ඛය යන විශේෂ ඥානයන් ........................................ නමින් හැඳින් වේ.

1.4 බුදුරදුන් වැඩි ම වස් ගණනක් වැඩ සිටියා වූ නගරය ........................................ නම් වේ.

1.5 බුදුරදුන්ට වැඩිපුර ලෙන්ගතුකමක් දක්වූ රජතුමා වූයේ .................................... ය.

- නිවැරදි පිළිතුරෙහි **අංකය, වරහන තුළ ලියන්න.**

1.6 'චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය' යනාදි බුද්ධාවවාද'ය සඳහන් වන පාලි මූලාශ්‍රය වන්නේ:
(1) මහාවංශය යි. (2) දීපවංශය යි.
(3) මහාවග්ගපාලිය යි. (4) දීඝනිකාය යි. (.........)

1.7 වේලුවනාරාමය බුදුරජාණන් වහන්සේට පූජා කෙළේ,
(1) අනේපිඬු සිටුතුමා ය. (2) කොසොල් රජතුමා ය.
(3) බිම්බිසාර රජතුමා ය. (4) අජාසත් රජතුමා ය. (.........)

1.8 භද්දවග්ගිය කුමාරවරුන් අමතා බුදුරදුන් දේශනා කළ ප්‍රකාශය වන්නේ:
(1) "බොහෝ දෙනාගේ හිතසුව පිණිස චාරිකාවේ හැසිරෙන්න" යන්න ය.
(2) "අප්‍රමාද ව ධර්මයෙහි හැසිරෙන්න" යන්න ය.
(3) "අනුන් ගැන සෙවීමට වඩා තමන් ගැන සෙවීම උතුම් ය" යන්න ය.
(4) "ස්ත්‍රීන්ට ලොල්වීම පරාභවයට හේතු වේ" යන්න ය. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

1.9 බුදුරදුන් විසින් 'ආචරිය - උපජ්ඣාය' තනතුරු හඳුන්වා දෙන ලද්දේ,
(1) ධර්ම ප්‍රචාරය සඳහා භික්ෂූන් පුහුණු කරවීම සඳහා ය.
(2) නො හික්මුණු භික්ෂූන්ට දඬුවම් කිරීම සඳහා ය.
(3) නවක - ශිෂ්‍ය භික්ෂූන්ට විනය උගන්වා හික්ම වීම සඳහා ය.
(4) දායකයන්ගෙන් සංඝයාට ලැබෙන සිවුපසය ක්‍රමවත් ව බෙද හැරීම සඳහා ය. (.........)

1.10 අටළොස් නිකායයන් සමගි කරවන ලද්දේ,
(1) අජාසත් රජු විසිනි. (2) කාලාශෝක රජු විසිනි.
(3) ධර්මාශෝක රජු විසිනි. (4) මහා පරාක්‍රමබාහු රජු විසිනි. (.........)

- **'A'** කොටසට **ගැළපෙන** පිළිතුර **'B'** කොටසෙන් තෝරා ගෙන, එහි **අංකය වරහන තුළ ලියන්න.**

| **'A' කොටස** | | **'B' කොටස** |
|---|---|---|
| 1.11 ඕදන්තපුරී | (.........) | 1. ප්‍රතිමා සම්ප්‍රදායකි. |
| 1.12 අවලෝකිතේශ්වර | (.........) | 2. චෛත්‍ය ස්ථානයකි. |
| 1.13 සප්තපර්ණි | (.........) | 3. ගුහාවකි. |
| 1.14 චාපාල | (.........) | 4. බෝධිසත්ත්වවරයෙකි. |
| 1.15 අමරාවතී | (.........) | 5. විශ්වවිද්‍යාලයකි. |

- පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙහි ඇති **වරහන තුළ යොදන්න.**

1.16 තුන්වැනි ධර්ම සංගායනාවේ දී අභිධර්ම පිටකය සම්පූර්ණ කරන ලදී. (.........)

1.17 ලොව විශ්මිත පරිනිර්වාණ මුද්‍රාවේ බුද්ධ ප්‍රතිමාව නිමවා ඇත්තේ කුසිනාරාවේ ය. (.........)

1.18 අටුවාචාරීන් වහන්සේලා බොහෝ දෙනකු ද්‍රවිඩ ජාතිකයන් යැයි පිළිගැනේ. (.........)

1.19 සාංචි විහාරය ජාත්‍යන්තර බෞද්ධ ධර්මදූත පුහුණු මධ්‍යස්ථානයක් විය. (.........)

1.20 ශ්‍රී ලංකාවේ මුල් ම දළද පෙරහර පවත්වන ලද්දේ කිත්සිරිමෙවන් රජතුමන් විසිනි. (.........)

**

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

45 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
* තෝරා ගත් ප්‍රශ්නවල කොටස් **හතරට ම** වෙන වෙන ම පැහැදිලි ව පිළිතුරු සපයන්න.
* ප්‍රශ්න කොටස් මිශ්‍ර කරගනිමින් පිළිතුරු සැපයීම **නො කළ** යුතු ය.

## II කොටස

**2.** (i) "මහා කරුණාව" හඳුන්වා දෙන්න.
(ii) බුදුරජාණන් වහන්සේගේ 'මහා කරුණා ගුණය' ප්‍රකට වූ **අවස්ථා දෙකක්** ගෙනහැර දක්වන්න.
(iii) "විභජ්ජව්‍යාකරණීය" දේශනා ක්‍රමය කෙටියෙන් හඳුන්වන්න.
(iv) "ශ්‍රාවකයන් ධර්මදූත සේවයෙහි මෙහෙය වූ බුදුරජාණන් වහන්සේ ද "යථාවාදී තථාකාරී" වූ සේක." සාකච්ඡා කරන්න.

**3.** (i) බෞද්ධ පබ්බජ්ජාවේ ආරම්භය හා විකාශය සැකෙවින් ගෙනහැර දක්වන්න.
(ii) බුදු සසුනෙහි ක්‍රියාත්මක වූ උපසම්පදා ක්‍රම අට නම් කරන්න.
(iii) 'වලභී' විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන - පරිපාලන ක්‍රියා පටිපාටිය පිළිබඳ විවරණයක් කරන්න.
(iv) ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාරස්ථානය විද්‍යාස්ථානයක් හා ප්‍රජාසේවා මධ්‍යස්ථානයක් ව පැවැති අයුරු පෙන්වා දෙන්න.

**4.** (i) ද්විතීය ධර්මසංගායනාවට පසුබිම් වූ හේතුසාධක ගෙනහැර දක්වන්න.
(ii) ද්විතීය ධර්මසංගායනාවේ ප්‍රතිඵල ශාසන චිරස්ථිතිය සඳහා උපයෝගී වූ ආකාරය විමර්ශනය කරන්න.
(iii) ධර්මය හා විනය ආරක්ෂා කිරීම ධර්මසංගායනාවල ප්‍රමුඛ අපේක්ෂාව වූ බව පෙන්වා දෙන්න.
(iv) "අශෝක ධර්මය නමින් හැඳින්වෙන්නේ ධර්ම විජය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අශෝක අධිරාජයා හඳුන්වා දුන් ධර්මය යි." විමසන්න.

**5.** (i) පණ්ඩුකාභය රජුගේ ජාතික - ආගමික සේවාවන් ප්‍රමාණවත් ව විස්තර කරන්න.
(ii) ප්‍රාග් - බෞද්ධ ලංකාවේ පැවැති ඇදහිලි හා විශ්වාස සමඟ නො ගැටී ජනතාවට බුදුසමය සමීප කරවීමට මිහිඳු මාහිමියන් ගත් ක්‍රියාමාර්ග විස්තර කරන්න.
(iii) මිහිඳු මාහිමියන් ලංකාවට වැඩමවා මුල් දින කිහිපය තුළ දී දේශනා කරන ලද සූත්‍ර අතුරෙන් **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.
(iv) "අනුරාධපුර යුගයේ සංඝයා අතර නිකාය භේදය ඇතිවීමට රජවරුන්ගේ ඇතැම් ක්‍රියාකලාපයන් ද මුල් විය." සනාථ කරන්න.

**6.** (i) අනුරාධපුර යුගයේ රාජ්‍යත්වය කෙරෙහි සංඝයාගෙන් කෙබඳු බලපෑමක් සිදුවීද'යි විමසන්න.
(ii) "අනුරාධපුර යුගයේ ක්‍රියාත්මක වූ අධ්‍යාපන ආයතනවල විෂයමාලාවට ධර්මශාස්ත්‍රීය මෙන් ම ලෞකික විෂයයන් ද ඇතුළත් විය." කරුණු දක්වන්න.
(iii) දුර්මතධාරීන් මැඩලමින් ථේරවාදී සම්ප්‍රදාය ආරක්ෂා කර ගැනීම සඳහා අනුරාධපුර යුගයේ පාලකයන්ගෙන් සිදු වූ මෙහෙය ඇගයීමට ලක් කරන්න.
(iv) 'මහාවිහාරය' ථේරවාදී සම්ප්‍රදායේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියාත්මක වූයේද'යි පරීක්ෂා කරන්න.

[ හතරවෙනි පිටුව බලන්න.

7. (i) මියන්මාරයට බුදුසමය මුලින් ම හඳුන්වා දුන් ආකාරය පැහැදිලි කරන්න.
   (ii) මියන්මාරයේ බුදුසමය ව්‍යාප්ත කිරීමට 'අනවරථ' රජුගෙන් සිදු වූ සේවය අගය කරන්න.
   (iii) ථායිලන්තයේ ක්‍රියාත්මක වන සංඝ සංවිධානයේ සංයුතිය ගෙනහැර දක්වන්න.
   (iv) නූතන ජපන් ජන සංස්කෘතිය කෙරෙහි බුදු සමයේ බලපෑම කෙබඳුද'යි විස්තර කරන්න.

8. (i) බුදුරදුන් හඳුන්වා දුන් ස්තූපාර්හ (ථූපාරහ) පුද්ගලයන් කවුරුන්ද'යි කෙටියෙන් හඳුන්වන්න.
   (ii) සාංචි ස්තූපයේ දක්නට ඇති සුවිශේෂ ලක්ෂණ මොනවාද'යි පෙන්වා දෙන්න.
   (iii) ගන්ධාර බුද්ධප්‍රතිමා කලාවේ විශේෂතා හඳුන්වා දෙන්න.
   (iv) ලංකාවේ 'පටිමාඝර' පිළිබඳ ව සනිදර්ශනාත්මක විග්‍රහයක් කරන්න.

9. (i) "ශ්‍රී ලාංකික කලාකරුවාගේ අග්‍රගණ්‍ය නිර්මාණයක් ලෙස 'සඳකඩ පහණ' හැඳින්විය හැකි ය." සාකච්ඡා කරන්න.
   (ii) 'සඳකඩ පහණ' පිළිබඳ ව පවත්නා විචාරාත්මක මත සමාලෝචනය කරන්න.
   (iii) 'චෛතියඝරයක' අවශ්‍යතාව පැහැදිලි කරමින් එහි ඇති කලාත්මක අගය පෙන්වා දෙන්න.
   (iv) බෞද්ධ සාරධර්ම ජනතාවට හඳුන්වා දීමේ මාධ්‍යයක් වශයෙන් 'බෞද්ධ සිතුවම් කලාව' ඇගයීමට ලක්කරන්න.

❋ ❋ ❋